Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - පෙරදිග සංගීතය

සතිය - 10 වන සතිය

ශ්‍රේණිය - 07

සැකසුම - අචලා දිසානායක මිය
ර/බළ/ආනන්ද මෛත්‍රෙය මධ්‍ය මහා විද්‍යාලය

## පාඩම :- ප්‍රස්තාරකරණයේ විශේෂිත අවස්ථා (සමග්‍රහ, විෂමග්‍රහ, අවග්‍රහ).

- සෑම සංගීත ක්‍රමයකම එහි ස්වර හෝ පද හෝ නියමිත පරිදි ග්‍රන්ථ ගත කිරීම සිදු වන්නේ ප්‍රස්තාර කිරීමෙනි.
- ප්‍රස්තාරකරණයේ දී ඒ සඳහා වූ සුවිශේෂ අංග රාශියකි.

## <u>ග්‍රහය</u>

- ගායනයක දී හෝ වාදනයක දී අත්ලෙන් ආඝාතය හෙවත් තාල ස්ථාන පවත්වා ගෙන යෑමට පෙළඹෙන ස්ථානය ***ග්‍රහය*** ලෙස හඳුන්වයි.
- මෙය දේශිය මෙන්ම හින්දුස්ථානී සංගීතයට ද පොදුය.
- ආඝාතය තැබීම, දෙඅත්ල, තාලම්පට හෝ ලී කැබලි යුගළයකින් සිදු කරයි.
- මාත්‍රා 2, 3 හා 4 ට අදාළ තෙවැදෑරුම් ගීත සඳහා තාල තැබීම නිදසුන් වේ.

  1 2 / 1 2
  1 2 3 / 1 2 3
  1 2 3 4 / 1 2 3 4

- මෙහිදී පළමු මාත්‍රාව මත තාලය පිහිටයි.
- එසේ ආඝාතය තැබීමේ දී ගීතයට හානි නොවන ආකාරයෙන් සිදු කරයි.
- දේශීය ජන සංගීතයේ දී තාලම්පොටින් නිකුත් වන ශබ්දය පහත පරිදි නම් කර ඇත. එහි සංකේතය ද පහත වේ.

  තිත් - ^ තෙයි - /

- මෙලෙස වයනුයේ විහිදෙන හඬ සහ හඬ නොවිහිදෙන ලෙසිනි.
- ග්‍රහය ප්‍රධාන කොටස් 03 කට බෙදනු ලබයි.
  1. සමග්‍රහය
  2. විෂමග්‍රහය
  3. අවග්‍රහය

- සමග්‍රහය
  - "සමග්‍රහය" යනු ගී පාදයක මුල් මාත්‍රාව මත ආඝාතය හෙවත් තාල තැබීමයි.
  - එසේ සිදු කිරීමේ දී ගීතයත්, තාලයත්, එකවර ආරම්භ වීම විශේෂත්වය යි.
  - එය ව්‍යවහාරික සංගීතයේ දී On the beat යනුවෙන් හඳුන්වනු ලබයි.

- අවග්‍රහය

- "අවග්‍රහය" යනු තාලය වාදනය කිරීමෙන් පසුව ගීතය ආරම්භ වීමයි.
- එහි දැකිය හැකි විශේෂත්වය වන්නේ ආඝාතය පළමුවෙන් ද, ගීතය දෙවනුව ද යෙදීමයි.
- අවග්‍රහය ගීත ප්‍රස්තාරයක දැක්වීමේ දී "+" යන සළකුණ භාවිතා කෙරේ.
- ව්‍යවහාරික සංගීතයේ දී අවග්‍රහය Off beat ලෙස නම් කරයි.
- බොහෝ ජන ගීත තුළ අවග්‍රහයෙන් ගීත ආරම්භ වීම දක්නට ලැබේ.

  උදා :- වැළපුම් ගී

- විෂමග්‍රහය
  - "විෂමග්‍රහය" යනු ගීතය ගායනා කිරීමෙන් පසු තාලය ආරම්භ වීමයි.
  - එහිදී පළමුවෙන්ම ගීතයත්, දෙවනුව තාලය හෙවත් ආඝාතයත් යෙදීම විශේෂත්වයයි.
  - විෂමග්‍රහ ගී පාද ප්‍රස්තාරයක දැක්වීමේ දී අවග්‍රහය දැක්වීම සඳහා භාවිතා කළ "+" ලකුණම යොදා ගනියි.

    උදා :- | + දු ර | පෙ නෙ න |

    | + + හෙළ | ජා s ති ක |

<u>පැවරුම</u>

- පහත සඳහන් ගීත හොඳින් ශ්‍රවණය කරන්න.
- එම ගීත සමග්‍රහ, විෂමග්‍රහ සහ අවග්‍රහ යන ග්‍රහ වර්ග 03 ට අදාළව වගු ගත කරන්න.
  - දුර පෙනෙන තැනිතලා
  - පෙරදිග මුතු ඇටයයි මේ
  - සසර වසන තුරු
  - හෙළ ජාතික අභිමානේ
  - ගලන ගඟකි ජීවිතේ
  - අම්මා සඳකි
  - ලංකා ලංකා
  - මට මැණික වගේ
  - සාධු දන්තදා

| සමග්‍රහ | අවග්‍රහ | විෂමග්‍රහ |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |